## (උ) ජාත්‍යන්තර ගනුදෙනු හා විදේශීය වත්කම්*

1961 ලංකාවේ ජාත්‍යන්තර ගනුදෙනු පිළිබඳ ගිණුම (විනිමය පාලන සංඛ්‍යා අනුව) 11 වැනි පරිශිෂ්ටයේ 25 අ, ආ සහ ඇ සංඛ්‍යා සටහන්වලින් දක්වා ඇත. මේ සටහන්වලින් දැක්වෙන පරිදි 1961 අවුරුද්දේ ලංකාවේ පිටරට මුදල් ශෙෂ අඩු වෙමින් පැවැතිණි. එසේ වුවද, පිටරට ගෙවුම් ශෙෂයෙහි සැලකිය යුතු දියුණුවක් ඇති විය. 1961 දී ද, වර්තන ගිණුමෙහි රුපියල් කෝටි 7·54 ක හිඟයක් ඇති විය, වර්තන ගිණුමෙහි පිට පිටම හිඟ ඇති වූ පස් වැනි අවුරුද්ද මෙය වුවද, 1958. 1959 සහ 1960 වර්ෂවල ඇති වූ හිඟයනට වඩා 1961 හිඟය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුය. පසුගිය තුන් අවුරුද්දේ ඇති වූ හිඟය පිළිවෙළින් රුපියල් කෝටි 15·29 ක්, 20·8 ක් සහ 22·05 ක් විය. 1961 ජාත්‍යන්තර ගනුදෙනු කෙරෙහි අති විශෙෂයෙන් කැපී පෙනෙන ලක්‍ෂණය වූයේ පිටරට පටවන භාණ්ඩවලින් ලැබූ ආදායම සැහෙන ප්‍රමාණයකින් අඩු වී තිබියදීත්, පිටරට ගෙවුම් ශෙෂයෙහි ඇති වූ දියුණුවයි. 1960 තෙක් අනුක්‍රමයෙන් වැඩි වී ගිය මෙරටට ගෙන්වන භාණ්ඩ ප්‍රමාණය, 1961 දී අපනයන වලට වඩා ප්‍රමාණවත් ලෙස අඩු විය. මේ නිසා 1960 රුපියල් කෝටි 20·28 ක් වූ වෙළෙඳ භාණ්ඩ ගිණුමේ හිඟය 1961 දී රුපියල් කෝටි 6·27 කට අඩු විය. ආදෘශ්‍ය ගිණුමේ පැවැති හිඟය 1960 දී රුපියල් කෝටි 1·77 ක් වුව ද, 1961 දී රුපියල් කෝටි 1·27 කට අඩු විය. මෙය ද වර්තන ගිණුම් ශෙෂය දියුණුවීමට මඳක් ඉවහල් විය .

---

* මේ වාර්ෂික වාර්තාවේ ජාත්‍යන්තර ගනුදෙනු සංඛ්‍යා ඉදිරිපත් කිරීමේ දී වැදගත් වෙනස්කම් දෙකක් ඇති කොට තිබේ.

(අ) පළමු වෙනස, වෙළෙඳ භාණ්ඩ ආනයන හා අපනයන වාර්තා කිරීමේ පදනම සම්බන්ධයෙනි. මීට පෙරාතුව ආනයන සහ අපනයන වලින් කොටසක් ර. ගැ. මිල අනුව ද කොටසක් නැ. වි. ස. මිල අනුවද වාර්තා කරන ලදි. එහෙත් සාමාන්‍ය ජාත්‍යන්තර සිරිතට අනුව, අපනයන මුළුමනින්ම නැ. වි. ස. මිල අනුවද, ආනයන ර. ගැ. මිල අනුවද මෙහි වාර්තා කොට ඇත. මේ අනුව ර. ගැ. මිල අනුව මෙතෙක් වාර්තා කැරුන අපනයනවලින් ගැල් කුලී හා රක්‍ෂණ වියදම් වෙළෙඳ භාණ්ඩ ලැබීම් වත්කම් වලින් අඩු කොට ඇත. මේ වියදම් බඩු පිටරට යවන්නා විසින් එකතු කොට පිටරට ගැල් කරුවනට සහ රක්‍ෂණ සමාගම්වලට ගෙවන නිසා ලංකාවේ වෙළෙඳ භාණ්ඩ අපනයන මිල ද ගැල් කුලී සහ රක්‍ෂණ කුලී ගෙවීම් ද පිඹිබීගිය සවභාවයක් දරීය. දැනට මෙය අත්හැර තිබේ.

මෙතෙක් නැ. වි. ස. මිල අනුව වාර්තා කැරුන ආනයන සම්බන්ධයෙන් පිටරට ගෙවන ලද ගැල් කුලී සහ රක්‍ෂණ වියදම් පැහැදිළිය. මෙතෙක් මේ වියදම් සටහන් කැරුනේ "ගැල් කුලී සහ රක්‍ෂණ ගෙවීම්." යටතේය. දැනට ඒ වෙළෙඳ භාණ්ඩ ආනයන යටතේ සටහන් වෙයි. එම නිසා ඒ වැඩි වෙයි.

මේ සංශොධනයේ ශුඬ ඵලය මෙසේය. (1) අපනයන අඩුවීම සහ ආනයන වැඩිවීම; මෙයින් වෙළෙඳ භාණ්ඩ ගිණුමේ හිඟය වැඩි වෙයි. (2) ගැල් කුලී සහ රක්‍ෂණ වියදම් අඩු වෙයි. එම නිසා, අදෘශ්‍ය ගිණුමේ හිඟය ද එම ප්‍රමාණයෙන්ම අඩු වෙයි.

ආදායම් මෙසේ නැවත වගී කිරීම නිසාත්, වෙළෙඳ භාණ්ඩවල ගැල් කුලී රක්‍ෂණ වියදම් ආදිය ගෙවීම නිසාත්, වර්තන ගිණුමෙහි පොදු ශෙෂයෙහි වෙනසෙක් ඇති වන්නේ නොවේ.

(ආ) දෙවැනි වෙනස වන්නේ විදේශීය සංචිත සම්බන්ධයෙනි. මෙතෙක් විදේශීය වත්කම් සංඛ්‍යා සකස් කැරුනේ පිටරට පොත් පදනම් කොට ගෙනය. දැනට මෙරට පොත් අනුව විදේශීය සංචිත පිළිබිඹු වන අයුරු විදේශීය වත්කම් සංඛ්‍යා සංශෝධනය කොට ඇත. මේ සංශෝධනයේ ප්‍රධානම ප්‍රතිඵලය වනුයේ සංචිත පිළිබඳ සංඛ්‍යා සවිස්තරව ඇතුළත් කිරීමය. මෙයට, (1) ද්විපාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම් යටතේ ලංකාවට අය විය යුතු දළ ශෙෂයන් ද. (2) විදේශීය බැංකු මගින් මුදල් සාරගැනීම සඳහා මෙරට බැංකු සතුව ඇති අපනයන බිල්පත් ද ඇතුළත් වෙයි. සංචිත සංඛ්‍යා පිළිබඳ මේ වෙනස්කම් ඇතුළුව ජාත්‍යන්තර ගනුදෙනු සංඛ්‍යා මෙරට පොත් අනුව, ඒකාකාරව ගුණනය කොට ඇත. මේ ක්‍රමය විදේශීය බැංකු සහ මූල්‍ය ආයතනවල ගිණුම් අනුව ජාත්‍යන්තර සංචිත සංඛ්‍යා සකස් කිරීමේ ජාත්‍යන්තර සිරිතට ද අනුකූල වෙයි.

ලංකාවේ විදේශීය වත්කම්, 1959 දී රුපියල් කෝටි 19·92 කින් ද, 1960 දී රුපියල් කෝටි 19·27 කින් ද පහළ වැටුන මුත්, 1961 දී පහළ වැටී ඇත්තේ රුපියල් කෝටි 0·83 කින් පමණෙකි. 1961 දී වර්තන ගිණුම් හිඟය අඩුවීම මෙහේ සංචිත ප්‍රමාණයෙහි පහළ වැටීම අඩු වීමට හේතු වූ ප්‍රධාන කරුණ විය මෙයට අමතරව, විශෙෂයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ලබා ගත් රුපියල් කෝටි 5·38 ක් ඇතුළුව විශාල ලෙස ලැබුණ විදේශීය ණය නිසා 1961 විදේශීය සංචිත වලින් කැරුන වියදම් සීමාවිය.

1961 දී ආනයන සහ අපනයන පහළ වැටීමට තුඩු දුන් හේතුන් මෙයට පළමු කොටසේ "විදේශීය වෙළෙඳාම" යටතේ සවිස්තරව දක්වා ඇත. එහි දක්වා ඇති පරිදි අපනයන වටිනාකම අඩුවීමට ප්‍රධානම හේතුව වී ඇත්තේ පිටරට පැට වූ භාණ්ඩ ප්‍රමාණයෙහි වෙනෙසෙක් නොවූන ද, එහි මිල වේගයෙන් අඩු වී යාමය. ආනයන සඳහා කැරුන ගෙවීම් අඩුවීමට ප්‍රධාන හේතුව වූයේ පිටරටින් ගෙන්වන ලද භාණ්ඩ ප්‍රමාණය සැලකිය යුතු ලෙස අඩුවීමය. ආනයන මිල දර්ශකය ඉරමක් පහළ වැටිණි. පාරිභෝගික භාණ්ඩ, අන්තර් භාණ්ඩ, සහ ආයෝජන භාණ්ඩ යන භාණ්ඩ ගණ තුනෙහිම ආනයන පරිමාව අඩු විය. මේ අඩුවීම විශේෂයෙන්ම කැපී පෙනුනේ 1960 අවසාන භාගයේදී සහ 1961 මුල් භාගයේදී තීරු බදු සහ සීමාකිරීම් ඇති කළ පාරිභෝගික භාණ්ඩ කෙරෙහිය. එවැනි භාණ්ඩ පුළුල් වශයෙන් සුඛෝපභෝගී සහ අත්‍යාවශ්‍ය නොවන භාණ්ඩ ලෙස වර්ගී කළ හැකිය.

වර්තන අදෘශ්‍ය ගිණුමෙහි මඳ දියුණුවක් ඇති වූයේ පිටරට ගමන්, ආයෝජන ආදායම් සහ රජයේ වියදම් සම්බන්ධයෙන් පිටරට යැවුන මුදල් ප්‍රමාණය අඩු වීම නිසාය. එහෙත් "විවිධ ගිණුම" යටතේ කැරුන ගෙවීම් වැඩිවීම නිසාත්, ගැල් කුලී සහ රක්ෂණ ගාස්තු වශයෙන් ලද ආදායම් අඩුවීම නිසාත් මේ වාසිය බොහෝ විට මැකී ගියේය.

1960 දී වූ අඩුවීමෙන් පසු, පිටරට ගමන් සඳහා ගෙවන ලද මුදල් අඩුවීමට ප්‍රධාන හේතුව වූයේ 1960 අවසාන භාගයේ දී පනවන ලද දූඩි විනිමය පාලන නීතිය. ආයෝජන ආදායම වශයෙන් ගෙවන ලද ප්‍රමාණය (දළ) 1960 රුපියල් කෝටි 7·6 ක් වූ අතර, 1961 එය රුපියල් කෝටි 6·17 තෙක් අඩු විය. මෙයට ප්‍රධාන හේතුව වූයේ ලාභාංශ වශයෙන් පිටරට යැවූ ප්‍රමාණය අඩු වීමය. ලාභාංශ ගෙවීම අඩුවීම නිසා ගෙවුම් ශෙෂයෙහි ඇති වූ වාසිය 1961 දී තව දුරටත් අඩු වූ විදේශීය වත්කම් සඳහා ලැබුණ පොළී ප්‍රමාණය අඩුවීම නිසා තරමක් දුරට මැකී ගියේය. රජයේ සමායතන සහ පිටරට සිටින දූත මණ්ඩල විසින් කැරුන වියදම අඩු කිරීම නිසා රජය විසින් පිටරට කැරුන වියදම් ද සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු විය.

ගැල් කුලී සහ රක්ෂණ ගාස්තු වශයෙන් ලද ශුඩ ආදායම් පහළ වැටීමට හේතු වූයේ කොළඹ වරායෙන් ලද ආදායම අඩුවීමය. වර්ෂය තුළ පැමිණි නැව් ගණන අඩුවීම නිසා නැව්නැවතුම් ගාස්තු වලින් ලද ආදායම ද අඩු විය. ගමන් ගාස්තු සහ නැව් කුලී අඩුවීම නිසා ගැල් කුලී සහ රක්ෂණ ගාස්තු වශයෙන් ගෙවන ලද ප්‍රමාණය ද අඩු විය. එහෙත් ඒ අඩුවීම ආදායමේ පහළ වැටීමට වඩා අඩු විය

සංඛ්‍යා සටහන II—50

**1960—1961 වර්තන අදාශයන්**

රුපියල් දශ ලක්ෂ

| | 1960 | | ශුඩ | 1961 (අ) | | ශුඩ |
|---|---|---|---|---|---|---|
| | බැර | හර | | බැර | හර | |
| **සේවා** | **246. 4** | **285. 7** | **— 39. 3** | **214. 5** | **248. 2** | **— 33.7** |
| මූල්‍ය නොවන රන් සංචලන (ශුඩ) | — | 1. 9 | — 1. 9 | — | 1. 9 | — 1. 9 |
| විදේශීය සංචාර | 8. 9 | 33. 2 | — 24. 3 | 7. 6 | 25. 3 | — 17. 7 |
| පරිවහණය හා රක්ෂණය * | 130. 1 | 54. 8 | + 75. 3 | 114 6 | 45. 9 | + 68. 7 |
| ආයෝජන ආදායම | 31. 8 | 76. 0 | — 44. 2 | 21. 3 | 61. 7 | — 40. 4 |
| ආණ්ඩුවේ වියදම | 29. 0 | 50. 3 | — 21. 3 | 27. 3 | 42. 6 | — 15. 3 |
| විවිධ | 46. 6 | 69. 5 | — 22. 9 | 43. 7 | 70. 8 | — 27. 1 |
| **පරිත්‍යාග** | **60.. 3** | **38. 7** | **+ 21. 6** | **58. 6** | **37. 6** | **+ 21. 0** |
| පෞද්ගලික මුදල් යැවීම් හා සංක්‍රමිකයන්ගේ මුදල් ගෙනයෑම් | 7. 8 | 38. 7 | — 30. 9 | 8. 3 | 37 6 | — 29· 3 |
| නිල පරිත්‍යාග | 52. 5 | — | + 52. 5 | 50. 3 | — | + 50. 3 |
| එකතුව | 306. 7 | 324. 4 | — 17. 7 | 273. 1 | 285. 8 | — 12. 7 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* මෙය පසුගිය වාර්ෂික වාර්තාවල දක්වා ඇති අන්දමට වඩා වෙනස්ය. සංශොධනය 50 වැනි පිටුවේ 1 (අ) අධෝ ලිපියෙන් සහ ii වැනි පරිශිෂ්ටයේ25 (ඇ) සංඛ්‍යා සටහනෙන් පැහැදිලි කොට ඇත. 1950 සිට එක් එක් වර්ෂය සඳහා ජාත්‍යන්තර ගනු දෙනු සංඛ්‍යා සාරාංශය සංශොධිත පදනම අනුව සකසා මේ සංඛ්‍යා සටහනේ දක්වා ඇත

(අ) තාවකාලිකයි.

## පෞද්ගලික ප්‍රාග්ධන සංචලන

1961 දී පෞද්ගලික ප්‍රාග් ධන ගිණුමෙන් රුපියල් කෝටි 0·57 ක් (ශුඬ) පිට රට ඇදී ගොස් ඇත. 1960 දී මෙසේ පිටරට ඇදී ගිය ප්‍රමාණය රුපියල් කෝටි 0·53 කි. 1960 දී ප්‍රාග් ධනය මෙරටට ඇදී ආවද, 1961 දී සුළු වශයෙන් වුව ප්‍රාග් ධනය පිටරටට ඇදීගිය බවක් වාර්තා වී ඇත. පසුගිය වාර්ෂික වාර්තාවේ දක්වා ඇති පරිදි මෙයට විශේෂ හේතුවක් විය. එනම්, පිටරට; ප්‍රධාන වශයෙන් මලයාවේ ආයෝජනය කළ ධනය ගෙන යාමය. කෙටි කාලීන ප්‍රාග් ධන සංචලන, ප්‍රධාන වශයෙන් ම විශේෂ ගිණුම්.[1] පහසුකම් ඇති වෙළෙඳ සමාගම්වල ශෙෂවලින්, පිළිබිඹු වන පරිදි, රුපියල් කෝටි 0·31 ක මුදලක් මෙරටට ලැබී ඇත. 1960 දී මේ ගිණුමෙන් පිටරටට ඇදී ගිය ප්‍රමාණය රුපියල් කෝටි 0·75 කි

සටහන II—51

### 1959—1960 සහ 1961 ගෙවුම් ශෙෂයන්හි පියවුම් ස්වරූපය

රුපියල් දශ ලක්ෂ

| | 1959 | 1960 | 1961 (අ) |
|---|---|---|---|
| භාණ්ඩ .. .. .. .. | — 182·9 | — 202·8 | — 62·7 |
| සේවා .. .. .. .. | — 13·5 | — 39·3 | — 33·7 |
| පෞද්ගලික මුදල් යැවීම් හා සංක්‍රමනිකායන්ගේ මුදල් යැවීම් .. .. .. | — 55·9 | — 30·9 | — 29·3 |
| පෞද්ගලික ප්‍රාග් ධන ගිණුම (ශුඬ) | | | |
| (අ) අවක්‍ර ආයෝජන .. .. | — 8·0 | + 2·2 | — 8·8 |
| (ආ) විශෙෂ ගිණුම් ශෙෂවල වෙනෙස (ශුඬ) | + 9·7 | — 7·5 | + 3·1 |
| ණය බේරීම් .. .. .. .. | — 26·6 | — 2·8 | — 4·9 |
| දීමනා - රත්රන් | | | |
| ජාත්‍යන්තර මුදල් මණ්ඩලය .. .. | — 35·7 | — | — |
| ජාත්‍යන්තර සංවර්ධන සමාගම .. | — | — | — 0·9 |
| ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුව .. .. .. | — | — | — 1·4 |
| මුළු අය වැය හිඟය | — 312·9 | — 281·1 | — 138·6 |
| පියවුම් ගිණුම | | | |
| **(අ) රාජ්‍ය හා බැංකු ප්‍රාග්ධනය*** | | | |
| 1. දළ විදේශීය වත්කම් වෙනස්වීම .. | + 199·2 | + 192·7 | + 8·3 |
| (අ) විදේශීය විනිමය අයිතිය .. | + 197·9 | + 207·3 | — 1·9 |
| (ආ) ලංකාවට ලැබිය යුතු ගෙවීම් ගිවිසුම් ශෙෂ .. .. | + 1·3 | — 14·6 | + 10·2 |
| 2. දළ විදේශීය වගකීම්වල වෙනස්වීම් .. | + 66·9 | + 6·0 | + 92·9 |
| (අ) 'ලංකාවෙන් ගෙවිය යුතු" ගෙවීම් ගිවිසුම් ශෙෂ .. | — 18·8 | — 0·1 | + 21·3 |
| (ආ) දීර්ඝ කාලීන වගකීම් † .. | + 42·2 | + 26·3 | + 23·8 |
| (ඇ) ජා. මු. අ. ගැනීම් .. .. | — | — | + 53·8 |
| (ඈ) අනෙකුත් †† .. .. | + 43·5 | — 20·2 | — 6·0 |
| **(ආ) රාජ්‍ය පරිත්‍යාග†††** .. .. | + 44·3 | + 52·5 | + 50·3 |
| **(ඇ) වැරදීම් හා අත්හැරීම්** .. .. | + 2·5 | + 29·9 | — 12·9 |

සංඛ්‍යා - ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(අ) තාවකාලිකයි.

* පියවුම් ගිණුමේ ධන ලකුණ වත්කම්වල අඩු වීම හෝ වගකීම්වල වැඩිවීම හෝ පෙන්වයි. ඍන ලකුණ වත්කම්වල වැඩිවීම හෝ වගකීම්වල අඩුවීම හෝ පෙන්වයි.

† සම්පූර්ණයෙන්ම, ජාත්‍යන්තර සංවර්ධන හා ප්‍රතිසංස්කරණ බැංකුවේ ණය මුදලින් සහ කැනේඩියානු හා අනෙකුත් ණය මුදල්වලින් සමන්විතය.

†† මහ බැංකුවේ හා වෙළෙඳ බැංකුවල මෙරට නේවාසික නොවන්නන්ගේ ගිණුම් ශෙෂයන්හි ද පිටරට තානාපති කාර්යාලවල ශෙෂයන්හි හා පී. එල්. 480 යටතේ වූ අනුරූප අරමුදල්හි ශෙෂයන්හි ද වෙනස්වීම් ඇතුළත් වෙයි.

††† රාජ්‍ය පරිත්‍යාග යන්නෙන් අදහස් කරනනේ ලංකාණ්ඩුවට ප්‍රධාන වශයෙන් භාණ්ඩ වලින් ලද පරිත්‍යාගය මෙයට, කොළඹ ක්‍රමය යටතේ කැනඩාවෙන් සහ ඕස්ට්‍රේලියාවෙන් ලද "කොයර්" කිරි සහ පිටි ප්‍රධාන වශයෙන් ගැනේ.

(1) මේ පහසුකම් යටතේ වූ ගනුදෙනුවලින්, රත්පවුම් සමාගම් හා අනෙකුත් විශාල වෙළෙඳ සමාගම් ඔවුන්ගේ ප්‍රධාන කාර්යාලයන් හා ප්‍රධානයන් සමග විනිමය පාලනයේ පරිපාලනය යටතේ කෙළින්ම කරන ගනුදෙනු දක්වෙයි. නොබේරූ ශෙෂයන් කලින් කල බැංකු ක්‍රමය මාර්ගයෙන් බේරනු ලැබේ.

## පියවුම් ගිණුම

1961 පැවැති පියවුම් හිඟය, පසුගිය අවුරුද්දේ හිඟයට වඩා සැහෙන ප්‍රමාණයකින් අඩුය. මෙයින් වර්තන ගිණුම් ශෙෂයෙහි ඇති වූ දියුණුව පිළිබිඹු වෙයි. 1961 පියවුම් හිඟය අඩුවීමත් සමගම, හිඟය පියවා ගත් ක්‍රමවලද සැලකිය යුතු වෙනසෙක් විය. 1959 සහ 1960 හිඟයේ වැඩි කොටසක් පියවා ගනු ලැබුයේ විදේශීය සංචිත අඩු කර ගැනීමෙනි. 1961 දී හිඟයෙන් වැඩි කොටසක් පියවා ගනු ලැබුයේ ලංකාවේ විදේශීය වගකීම් වැඩි කර ගැනීමෙන් සහ විදේශීය ආධාරවලිනි. මේ නිසා විදේශීය සංචිත අඩු කිරීමට අවශ්‍ය වූයේ ඉතා සුළු වශයෙනි. ලංකාවේ විදේශීය වගකීම් වැඩිවීමට ප්‍රධාන හේතුව වූයේ 1961 අප්‍රේල් මාසයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් රුපියල් කෝටි 5.38 ක් වටිනා විදේශීය විනිමය මිලයට ගැනීමය. වගකීම් වැඩි වීමේ අනෙක් හේතුන් වූයේ ලංකාවේ ද්විපාර්ශ්වීය ගෙවුම් ගිවිසුම් යටතේ කෙටි කාලීන ණය වශයෙන් රුපියල් කෝටි 2·13 ක් ද, ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවෙන්, සංවර්ධන ණය අරමුදලෙන් සහ එක්සත් සමාජවාදී සෝවියට් සමූහාණ්ඩුවෙන් රුපියල් කෝටි 2. 38 ක්, දීර්ඝ කාලීන ණය වශයෙන් ලබා ගැනීමය.

## ප්‍රාදේශීය ගනු – දෙනු පිළිවෙළ

ලංකාවේ වර්තන ගිණුමේ ගෙවුම් ශෙෂය පෙර වර්ෂවල පැවැති පිළිවෙළටම පැවැතිණි. මේ අනුව ඩොලර් කලාපය සම්බන්ධයෙන් අතිරික්තයක් ද, අනෙකුත් මුදල් කලාප සම්බන්ධයෙන් හිඟයක් ද සටහන් වී තිබේ. ඩොලර් කලාපය සම්බන්ධයෙන් සටහන් වී ඇති අතිරික්තය පසුගිය පස් අවුරුද්ද තුළ සටහන් වී ඇති ප්‍රමාණයට වඩා තරමක් වැඩිය. එසේම රත්පවුම් කලාපය සම්බන්ධව ඇති හිඟය රුපියල් කෝටි 22·88 ක් වන අතර, 1957 සිට 1960 දක්වා කාලය තුළ සටහන් වී ඇති සාමාන්‍ය හිඟය වන රුපියල් කෝටි 29·0 ට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු බව පෙනේ. රත්පවුම් කලාපයේ, එක්සත් රාජධානිය, ඉන්දියාව හා පකිස්ථානය සම්බන්ධයෙන් සටහන් වී ඇති හිඟය 1960 වර්ෂය හා සසඳන විට රුපියල් කෝටි 11·39 කින් සහ රුපියල් කෝටි 4·05 කින් අඩුය. අනෙකුත් රත්පවුම් කලාපීය රටවල් වන ඕස්ට්‍රේලියාව සහ මලයාව සම්බන්ධයෙන් තුබුණ අතිරික්තය මඳක් අඩු වී ඇති බව සටහන් වී තිබේ. රත්පවුම් කලාපයේ වර්තන ගිණුම් හිඟය අඩු වීමට මුළුමනින් ම හේතු වී ඇත්තේ ආනයන සඳහා මේ කලාපයට කැරුන ගෙවීම් අඩුවීමය. රත් පවුම් සහ ඩොලර් කලාපවලින් බාහිර රටවල් සමග පැවති හිඟය 1957 සිටම පැවත එන පිළිවෙළටම අනුව 1961 දී ද රුපියල් කෝටි 6·02 ක් විය. 1960 දී වූ හිඟය රුපියල් කෝටි 5·15 ක් විය. මෙයට හේතු වූයේ යුරෝපීය ආර්ථික ප්‍රජාවට අයත් නොවන රටවල් වන චීනය, ජපානය සහ මැද පෙරදිග රටවල් සම්බන්ධයෙන් 1960 සටහන්ව තුබූ අතිරික්තය 1961 දී හිඟයක් බවට පරිවර්තනය වීමය. මහාද්වීපික යුරෝපීය ආර්ථික ප්‍රජාවට* අයත් රටවල් සම්බන්ධයෙන් 1961 දී සටහන් වී ඇති හිඟය රුපියල් කෝටි 2·98 කි. මෙය 1960 වර්ෂයට වඩා රුපියල් කෝටි 3·32 කින් අඩු විය.

දියුණු වූ ගෙවුම් ශෙෂය, කාලච්ඡේදය වශයෙන් බෙදා බලන විට, පසුගිය අවුරුදු තුනේ දී පැවැති පිළිවෙළම අනුගමනය කළේය. එය වර්තන ගිණුම් ශෙෂය දෙවැනි සහ සිව් වැනි කාර්තුවල දීට වඩා පළමු වැනි සහ සිව් වැනි කාර්තුවලදී වාසි සහගත වී ඇති බව හෙළි කරයි. මෙයට හේතුව වශයෙන් දැක්විය හැක්කේ, පළමු වැනි සහ තුන් වැනි කාර්තුවල දී අපනයන ඉපැයුම් වැඩි වන අතර, ආනයන ගෙවීම් දෙවැනි සහ තුන් වැනි කාර්තුවල දී වැඩි වීම ය. 1961 දී තුන් වැනි කාර්තුවේ හිඟය විශෙෂයෙන් වැඩිය. මෙයට හේතුව ආහාර, ආනයනය සඳහා රජයේ ගෙවීම් රොක්වී මේ කාර්තුවේ දී ගෙවීමය

---

* මහාද්වීපික යුරෝපීය ආර්ථික ප්‍රජාවට බටහිර යුරෝපය, තුර්කිය හා ග්‍රීසිය යන රටවල් අයත් වෙයි.

සංඛ්‍යා සටහන II—52

**1960 සහ 1961 වර්තන ගිණුම්, මුදල් කලාප අනුව**

| | 1960 | | | 1961 (අ) | | |
|---|---|---|---|---|---|---|
| | බැර | හර | ශුඩ | බැර | හර | ශුඩ |
| **1. ඩොලර් කලාපය** | 346.6 | 144.6 | + 202·0 | 336·1 | 122·5 | + 213·6 |
| **2. රන්පවුම් කලාපය** | 1,041·5 | 1,412.4 | — 370.9 | 1,024·5 | 1,253.3 | — 228·8 |
| i එක්සත් රාජධානිය | 618·1 | 795·2 | — 177·1 | 615·3 | 678·5 | — 63·2 |
| ii ඉන්දියාව හා පකිස්ථානය | 77·0 | 319·5 | — 242·5 | 75·3 | 277·3 | — 202·0 |
| iii අනෙකුත් | 346·4 | 297·7 | + 48·7 | 333·9 | 297·5 | + 36·4 |
| **3. ඩොලර් හෝ රන්පවුම් නොවන කලාප** | 714.6 | 766·1 | — 51·5 | 632·2 | 692·4 | — 60·2 |
| i යු. අා. ප්‍ර. රටවල් | 210·0 | 273·0 | — 63·0 | 187·6 | 217·4 | — 29·8 |
| ii අනෙකුත් | 504·6 | 493·1 | + 11·5 | 444·6 | 475·0 | — 30·4 |
| එකතුව | 2,102·7 | 2,323·2 | — 220·5 | 1,992·8 | 2,068·2 | — 75·4 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

(අ) තාවකාලිකයි·

**විදේශීය සංචිත**

1961 දී ලංකාවේ විදේශීය සංචිත අඩු වී ඇත්තේ, රුපියල් කෝටි 0·83 කින් පමණකි. මෙය පසුගිය සිව් වසර තුළ පහළ වැටී ඇති ප්‍රමාණයට වඩා සෑහෙන ප්‍රමාණයකින් අඩුය, මෙහින් ප්‍රධාන වශයෙන් ම පිළිබිඹු වන්නේ, එක් අතකින් වර්තන ගිණුම් හිඟය රුපියල් කෝටි 14·5 කින් අඩුවීමෙන් ඉහත සඳහන් කළ පරිදි මූලික වශයෙන් ගෙවුම් ශෙෂයෙහි ඇති වූ දියුණුව සහ ලංකාවේ කෙටි කාලීන සහ දිගු කාලීන වගකීම් රුපියල් කෝටි 9·3 කින් වැඩි වීමත් ය. දෙ වැන්න සඳහා මූලික හේතුව වූයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් රුපියල් කෝටි 5·38 ක් ගැනීමය.

ගෙවුම් ශෙෂ තත්ත්වය මුළුමනින් ගෙන බලන විට එහි දියුණුවක් ඇති වී තුබුන ද, 1961 අවසානයේ දී රුපියල් කෝටි 53. 3 ක් වූ සංචිත ප්‍රමාණය හේතූන් ගණනක් නිසා සතුටුදායක යැයි කිව නොහැකිය. පළමුවෙන්ම 1961 දී වැඩි වූ විදේශීය වගකීම්ය. දෙ වැනිව, මෑත මාස වල දී අපනයන මිල අඩු වී යාමය. තෙ වැනිව ආර්ථික සංවර්ධන කටයුතු වැඩිවීම නිසා විශෙෂයෙන් ප්‍රාග්ධන භාණ්ඩ සඳහා වැඩි වූ ඉල්ලුම් තත්ත්වයය. මේ නිසා ආනයන ගෙවීම් සහ අනෙකුත් විදේශීය ගෙවීම් සීමා කිරීමත්, රට තුළ මුදල් සැපැයුම අඩු කරලීමටත් යොදන ලද දැඩි උපක්‍රම එසේම පවත්වාගෙන යා යුතු විය.

සංලක්ෂ්‍යය:–

**වෙළෙඳ ශේෂ හා වෙළෙඳ භාණ්ඩ ගිණුම**

විදේශීය ගෙවුම් ශේෂ වාර්තා සකසා ඇත්තේ විදේශීය ලැබීම් හා ගෙවීම් අනුව වූ විනිමය පාලන වාර්තා පදනම් කොට ගෙනය. ඇතුළත් කරන භාණ්ඩ හා කාලීය වෙනස්කම් නිසා ගෙවුම් ශේෂ වාර්තාවල දක්වා තිබෙන වෙළෙඳ භාණ්ඩ ශේෂය රේගු වාර්තා අනුව සකසා ඇති වෙළෙඳ ශේෂයට වඩා වෙනස් වෙයි **කාලීය වෙනස** - බඩු ගෙන්වීම සහ ඊට ගෙවීම අතර කාලයේ පරතරයක් සාමාන්‍ය යෙන් ඇති වේ. 1960 දී පරිදි භාණ්ඩ ආනයන අඩුවීමත් සමග ආනයන සඳහා ගෙවීමද කාලයේ පරතරයක් සමගම අඩු විය. මෙසේ 1961 ගෙවීම් එම වර්ෂයේ නියම වශයෙන් ගෙන්වා ඇති භාණ්ඩවලට වඩා වැඩිය. පසුගිය අවුරුද්දේ බුරුමයෙන් ගෙන්වන ලද සහල් සඳහා 1961 මුල් මාසවලදී විශාල ලෙස වූ ගෙවීම් වලින් ද මෙය පැහැදිලි වෙයි. **ඇතුළත් කෙරෙන** භාණ්ඩ- ප්‍රධාන වෙනස වනුයේ අපනයන සම්බන්ධයෙනි. වෙළෙඳ වාර්තා අනුව අපනයන වලට, ප්‍රධාන වශයෙන් (කොළඹට පැමිණෙන නැව් වලට දෙන තෙල් සහ අනෙකුත් ඉන්ධන) ප්‍රති අපනයන ඇතුළත් වෙයි. ජාත්‍යන්තර වර්ග කිරීමට අනුව මේ ප්‍රති අපනයන ශීර්ෂය ගෙවුම් ශේෂ වාර්තාවල දක්වා ඇත්තේ පරිවහන ඉපැයීමක් වශයෙනි. මේ වෙනස ගලපා බැලූවිට, වෙළෙඳ වාර්තාව අනුව වූ අපනයන සංඛ්‍යා සහ විනිමය පාලන වාර්තා අනුව වූ සංඛ්‍යා බොහෝ දුරට එකිනෙකට සමාන වෙයි.